**මඩුල්ල ප්‍රාදේශීය සභාවේ - 2021**

**--------------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පරිසනක මධ්‍යස්ථාන සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 67,800ක් වටිනා යන්ත්‍ර උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබීමෙන් යන්ත්‍ර හා උපකරණ සහ ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රාදේශිය සභාවට අයත් බව හදුනාගෙන ඇති අතර ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ස්ථාවර වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2021 ඔක්තෝබර් 22 දින වැඩ අවසන් කර තිබුණු රු. 7,596,000ක් වටිනා ජංගම වෙළඳ කුටි 80 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබීමෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායම් මගින් දායකය එම | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරන බව දන්වා ඇත. | ස්ථාවර වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | මකුල්ල සතිපොළ භූමිය වැඩි දියුණු කිරීමේ නිම් වැඩවල මුළු වටිනාකම රු. 8,832,282 ක් වුවද එම වටිනාකම රු. 4,293,497 ක් ලෙස දැක්වීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 4,538,785ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරන බව දන්වා ඇත. | සභාව සතු ගොඩනැගිලිවල නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගතකළ කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා ගෙවා තිබුණු රු. 150,500 ක් ප්‍රාග්ධන වැය ගිණුමට දෙවරක් සටහන් කිරීමෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී එවැනි වියදම් ආදායමට නොගෙන අදාල වියදම් ශිර්ෂයට බැර කිරිමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාලව 2022 වර්ෂයේ ගෙවන ලද රු. 463,667 ක වියදම සමාලෝචිත වර්ෂයේ ණය හිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබීමෙන් ණයහිමි ගිණුමේ ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් සහ අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේදි ගෙවන ලද 2021වර්ෂයට අදාල වියදම් 2021වර්ෂයේ ණයහිමියන් ලෙස වෙන්කර ගිණුම්ගත කරන බව දන්වා ඇත. ඉදිරි වර්ෂයේ දී නිවරැදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ණයහිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඊ) | 2021 වර්ෂයට අදාලව රු. 1,474,303 ක මුද්දර ගාස්තු ලැබීම් උසාවි දඩ ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ නිවැරදිව ගිණුම් ගත කරන බව දන්වා ඇත. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (උ) | සභාව විසින් අනුගමනය කරනු ලබන කෙරීගෙන යන වැඩ හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය සහ ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ගිණුම්කරන ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |

**1.6.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සභාව විසින් අයකර තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර පරීක්ෂණ ගාස්තු වලින් සියයට 50 ක දීමනාවක් වශයෙන් රු. 108,250 ක් විධිමත් අනුමැතියකින් තොරව අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකරන ලද නිළධාරින්ට ගෙවීම්කර තිබුණි. | එම මුදල වැරදීමකින් ගෙවන ලද්දක් බවත් නැවත අයකර ගැනීමට නිලධාරීන් දැනුවත්කර ඇති බවත් දන්වා ඇත.. | විධිමත් අනුමැතියක් ලබාගෙන දීමනා ගෙවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 6,778,709 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,371,669 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර 02 ක්, බැකෝ ලෝඩර් යන්ත්‍රයක් සහ ටිපර් රථයක් කුලියට දීමේදී ප්‍රමාණවත් අත්තිකාරම් මුදලක් ලබා නොගැනීම නිසා 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 1,229,100 ක කුලී ආදායම් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ යන්ත්‍ර කුලී අයකර ගත යුතුය |